09 ශ්‍රේණිය නර්තනයට අදාලව, තෙවන වාරයට නියමිත, “**පංච තූර්ය වාද්‍ය භාණ්ඩ**” පාඩමට අදාලව විෂයය කරුණු මෙහි ඇතුළත් කර ඇත. රූප සටහන් බලා හොඳින් කියවා, අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න

## පංච තූර්ය වාද්‍ය භාණ්ඩ

අතීතයේ සිටම පැවත එන වාද්‍ය භාණ්ඩ **පංචාංගික තූර්ය නාදය** ලෙසද **පසඟතුරු ඝොස** ලෙසද හඳුන්වනු ලබයි. මහාවංශ ටීකාවේ දැක්වෙන පරිදි අශෝක අධිරාජයාගේ නියමය පරිදි බෝධි ශාඛාවකට පැවැත්විය යුතු ඉහළම පූජාව පංචාංගික තූර්ය නාදය ලෙස හඳුන්වා ඇත.

මෙම පංච තූර්ය වාදනය ප්‍රධාන කොටස් 5 ට බෙදා දක්වයි.

- ආතත
- විතත
- විතතාතත
- ඝන
- සුෂිර

**ආතත** යනුවෙන් හඳුන්වනු ලබන්නේ, අතින් පමණක් වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩයි. ඒවා නම්


ගැට බෙරය


පහතරට බෙරය


උඩැක්කිය


රබාන

**විතත** යනුවෙන් හඳුන්වන්නේ කඩිප්පුවක ආධාරයෙන් වාදනය කරන වාද්‍ය භාණ්ඩයි. උදා,


තම්මැට්ටම

**විතතාතත** යනු අතින් හා කඩිප්පුවෙන් වාදනය කරනු ලබන වාදන භාණ්ඩයි. උදා:



දවුල

**ඝන** වාද්‍ය භාණ්ඩ යනුවෙන් හඳුන්වන්නේ ලෝහමය ද්‍රව්‍ය වලින් නිර්මාණය කරන ලද වාද්‍ය භාණ්ඩයි. උදා:





තාලම්පට

පන්තේරුව

**සුෂිර** යනු , සුළගේ ආධාරයෙන් වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩයි. උදා:







හක්ගෙඩිය

බටනළාව

හොරණෑව

මෙම වාද්‍ය භාණ්ඩ සමූහයම වාදනය කරන අවස්ථා ඇත.

| ආගමික උත්සව | සමාජීය උත්සව |
| --- | --- |
| පෙරහැර | ශාන්තිකර්ම |
| පිරිත් පින්කම් | අවමංගල්‍ය උත්සව |
| තේවා වාදන | තූර්ය වාදන |
| | සන්දර්ශන, |
| | ජාතික උත්සව |

කාර්ය පත්‍රිකාව - පහත රූප සටහන් බලා එහි තිබෙන පංච තූර්ය වාදන මොනවාදැයි රූප සටහන් ඉදිරියේ ලියන්න. එක් රූපයක පංච තූර්ය භාණ්ඩ කීහිපයක්ම තිබේ නම් සියල්ලම නම් කරන්න









<u>09 ශ්‍රේණිය නර්තනයට අදාලව, තෙවන වාරයට නියමිත,</u> "ශාන්ති කර්ම හඳුනා ගනිමු"පාඩමට අදාලව විෂයය කරුණු මෙහි ඇතුළත් කර ඇත. <u>හොඳින් කියවා, අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න</u>

## <u>ශාන්ති කර්ම හඳුනා ගනිමු</u>

### ශාන්තිකර්ම

ශාන්තිකර්ම යනු කිසියම් පුද්ගලයෙකුට ඇතිවූ මානසික සුභ සිද්ධිය සඳහා දෙවියන් ,යකුන්,ග්‍රහයන් වෙනුවෙන් ඇතිවන බලවේග දුරුකර ගැනිමට යොදා ගන්නා කිසියම් සුභ කාර්යයකි.සෙතක් ශාන්තියක් වෙනුවෙන් මිනිසුන්ගේ සිත්තුළ ඇතිවන සුවපත් බව ශාන්ති කර්ම තුළින් ඉටුවේ.

දේශීය නර්තන සම්ප්‍රදායන් 3 වෙනුවෙන් ශාන්තිකර්ම පැවැත්වේ. ඒ අතර

- උඩරට නර්තන සම්ප්‍රදාය - කොහොඹා කංකාරිය ශාන්තිකර්මය.
- පහතරට නර්තන සම්ප්‍රදාය - දෙවොල් මඩුව ශාන්තිකර්මය.
- සබරගමු නර්තන සම්ප්‍රදාය - පහන් මඩුව ශාන්තිකර්මය.

ශාන්තිකර්ම පැවැත්විමේ අරමුණු ඒ ඒ සම්ප්‍රදායට අනුව වෙනස් වේ.

| ශාන්තිකර්මය | අතීතයේ පැවැත්වීමට හේතු | වර්තමානයේ පැවැත්විමට හේතු |
|---|---|---|
| කොහොඹා කංකාරිය | පඩුවස්දෙව් රජුට වැළදුනු දිවිදෝසය නිසා හටගත් රෝගය සුවපත්ව කිරිමට. | භව භෝග සම්පත් වැඩි දියුණු කිරිමට, රෝගාබාධයන් සුව කර ගැනිමට, ගමට, රටට. සෙත් ශාන්තිය සඳහා හා අධ්‍යාපන අවශ්‍යතාවන් වෙනුවෙන්. |
| දෙවොල් මඩුව | සේරමාන් රජුට ඇතිවූ හිසරදය සුව කිරිමට. | සශ්‍රිකත්වය උදෙසා, ගමට, රටට සෙත් පතා, රෝග නිවාරණයට, අධ්‍යාපනික අවශ්‍යතතා සඳහා. |
| පහන් මඩුව | සේරමාන් රජුට ඇතිවූ හිසරදය සුව කිරිමට. | පත්තිනි මෑණියන්ගේ ලෙඩ / දෙවියන්ගේ ලෙඩ ලෙස ගැමියන් හඳුන්වන රෝග වලිවලින් මිදිමට, ගමට, රටට . සෙත් පැතිමට, භව භෝග සම්පත් දියුණු කිරිමට හා අධ්‍යාපනික අවශ්‍යතා සඳහා. |

මෙම ශාන්තිකර්ම සඳහා වෙන වෙනම පුරාවෘත්ත කථා ඇත. ඒ අතර

කොහොඹා කංකාරිය ශාන්ති කර්මය ,

- විජය කුවේණී කතාවේ ඔවුනට ජීවහත්ත,දිසාලා නම් දරුවන් දෙදෙනකි. විජය රජු කුවේණී අතහැර ගිය අවස්ථාවේ කෝපයට පත් කුවේණි රජුට ශාප කළහ. විජය රජු ගේ ඇවෑමෙන් රට පාලනය කල පඩුවස්දෙව් රජුට ඒ ශාපය වැදිණි. එහිදි පඩුවස්දෙව් රජුට සිහිනයෙන් දිවි වෙසක් දැක බියපත් වී රෝගාතුරව කොහොඹා කංකාරිය ශාන්තිකර්මය කළහ. ඒ සඳහා ශක්‍ර දේවේන්ද්‍රයා මානෙල් මලින් උපන් කෙනෙකු සොයා යාගයක් කළහොත් සුවවන බව

පැවසීය.මේ සඳහා රාහු අසුරේන්ද්‍රයා හට ඌරු අවතාරයක් ලබා දී මලය රටට ගොස් මලය රජුගේ නන්දන උයන පාළු කර, ඒ බව සැලවුණු රජු දුනු හී ගෙන ඌරා ඇල්ලීමට ගිය අවස්ථාවේ ඌරා ලුහුබැඳ ලක්දිවට පැමිණියහ. එහිදි හන්තානා කන්දට ආ ඌරා කන්ද අසලදි ගලක් බවට පත් විය. එතැන අසලට ආ සක් දෙව් රජු එතුමා ගෙන්වූ හේතුව විස්තර කළහ. ඉන්පසු මලය රජු ඇතුළු පිරිස අනුරාධපුරයේ මහමෙවුනා උයනේ නියමිත දිග, පළල සහිත මණ්ඩපයක් සාදා ශාන්තිකර්මය කිරිමෙන් අනතුරුව දිවිදෝෂය සුවපත් වී ඇත.

දෙවොල් මඩුව / පහන් මඩුව

- සේරමාන් රජුගේ උයන පාළු කරමින් සිටි ගෝනෙකු මරා දමන ලෙස රජු අණ කරන ලදී. හේවායින් ගෝනා පසුපස එළවීමේදි ගෝනාගේ පය පැටලී අසල පොකුණට වැටිමෙන් පසු මරණයට පත් විය. රජු තමාට කළ විපත දැනගත් ගෝනා රජුගෙන් පළිගැනිමට පොකුණේ මලක කුඩා මැඩියෙක්ව ඉපිද, දිනක් රජු මල ආග්‍රණය කිරිමේදි මැඩියා නාසයට ගියේය. ඉන් පසු රජුට හට ගත් හිසරදය සුව නොවිමය. දිනක් රජුට හීනෙන් රූමත් කාන්තාවක් දැකිම නිසා මේ බව පුරෝහිතට දැන්විමෙන් පසු ඒ පෙනී ඇත්තේ පත්තනි දේවිය බවත්, බෞද්ධාගම ස්ථාපිත රටකට ගොස් පින් පැමිණියහොත් රෝගය සුව වන බව පැවසිය. එහිදි ලංකාව තෝරා ගෙන කැළණියට ගොස් බුදුන් වැඳ දෙවියන්ට පිං දී රුවන්වැල්ලේ දී දෙවොල් මඩුව ආරම්භ කළ බව කියැවේ.

## මේ එක් එක් ශාන්තිකර්ම වල පුද ලබන දෙවිවරු වන්නේ,

කොහොඹාකංකාරිය - කොහොඹා දෙවියන්,කොහොඹා තුන් කට්ටුව(අලුත්/මහ/පරණ කොහොඹා)
දෙවොල් මඩුව - පත්තිනි, දෙවොල්, දොළහ දෙවිවරුන්.
පහන් මඩුව - පත්තිනි, විෂ්ණු සමන්, කතරගම, විභීෂණ, නාථ, දෙවොල් හා වාහල දෙවිවරුන්ය.

මෙම ශාන්තිකර්මවල චාරිත්‍ර විධි අතර කප් සිටුවීම,තොටපේ කිරිම, මල පේ කිරිම,රුක් පේ කිරිම යනාදිය ප්‍රධාන වේ.

මෙම ශාන්තිකර්මවල නර්තන, ගායන,වාදන වන්නේ,

| ශාන්තිකර්ම | නර්තන | ගායනා | වාදන |
|---|---|---|---|
| කොහොඹා කංකාරිය | ගායනා සහිත-අස්නේ,කොහොඹා හැල්ල, මඩුපුරය සහිත මල් හත්පදය<br>ගායනා රහිත ආවැන්දුම,<br>යක් ඇනුම හත්පදය, කෝල්පාඩුව. | කෝල්මුර කවි,අයිලේ යැදීම,මහයාතිකාව, හඟලයැදීම, සන්න, සැහැලි, යාදිනි. | මඟුල් බෙර,<br>අත්‍යාබෙර,<br>යක්තුංපදය. |
| දෙවොල් මඩුව | තොරණ් යාගය,තෙල්මෙ,දෙවොල්, පත්තිනි හා වාහල | නමස්කාර,අෂ්ටක,<br>ශ්ලෝක,<br>උපත්කවි ආදි ගායනා | මඟුල්බෙර,<br>දැකුම් අත්,<br>වැදුම් අත්,<br>පිං බෙර |
| පහන් මඩුව | යහන්දැක්ම,දේවකෝල්පාඩුව,<br>හත්පද පෙළපාලිය,පන්දම් පද | නමස්කාර,අෂ්ටක,<br>ශ්ලෝක,<br>උපත්කවි ආදි ගායනා | මංගලදවුල් වාදනය,<br>දැකුම් අත්,<br>පිං බෙර. |

මෙම ශාන්තිකර්ම ත්‍රිත්වයේම පොදුවේ සැරසිලි තොරන්, මඩු,යහන්,අයිලේ කත්තිරික්ක, ආදි ප්‍රධාන වේ. ඒවා සරසීම සඳහා ගොප් කොළ, කෙසෙල් බොඩ, අතු, හබරල කොළ ආදි පරිසරයෙන් ලබා ගන්නා අමුද්‍රව්‍ය භාවිතා කරයි.

මෙම ශාන්ති කර්මවල ප්‍රධාන රංගවස්ත්‍රාභරණ ලෙස උඩරට නර්තන සම්ප්‍රදායයේ වෙස් ඇඳුම් කට්ටලය ද, පහතරට නර්තන සම්ප්‍රදායයේ තෙල්මෙ, දෙවොල්, පත්තිනි ඇඳුම් කට්ටලය ද, සබරගමු නර්තන සම්ප්‍රදායයේ පබළු ඇඳුම් කට්ටලය ආදි රංග වස්ත්‍රාභරණ සඳහා භාවිතා කරයි .මෙම ශාන්ති කර්ම වල සමානතා මෙන්ම අසමානතා දක්නට ලැබේ.


උඩරට වෙස්


තෙල්මෙ


පහතරට දෙවොල්



පත්තිනි


සබරගමු

ඇගයිම:- 1. කොහොඹකංකාරිය, දෙවොල් , පහන් මඩුව යන ශාන්තිකර්ම අතීතයේ හා වර්තමානයේ පැවැත්විමට හේතු දක්වන්න.

2. පුරාවෘත්ත කථා කෙටියෙන්ලියන්න.
3. පුද ලබන දෙවිවරුන් නම් කරන්න.
4. ශාන්තිකර්මවල එන නර්තන, ගායන, වාදන අංග නම් කරන්න.
5. මෙම ශාන්තිකර්මවල රංග වස්ත්‍රාභරණ හා සැරසිලි නම් කරන්න.

09 ශ්‍රේණිය නර්තනයට අදාලව, තෙවන වාරයට නියමිත, “ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායකවූ ශිල්පීන් අගයමු”පාඩමට අදාලව විෂයය කරුණු මෙහි ඇතුළත් කර ඇත .හොඳින් කියවා, අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න

## නර්තන ශිල්පීන්

### විල්සන් ඔලබොඩුව ගුරුතුමා

- මෙතුමා කළුතර දිස්ත්‍රික්කයේ ඔලබොඩුව ග්‍රාමයේ උපත ලැබූ අයෙකි.
- ඔහු විල්සන් ප්‍රනාන්දු හෙවත් විල්සන් ඔලබොඩුව නමින් ප්‍රසිද්ධ විය.
- පහතරට නර්තන සම්ප්‍රදායේ රයිගම් ශෛලිය ප්‍රගුණ කළ නර්තන, වාදන ශිල්පියෙකි.
- උඩරට,පහතරට බෙර වාදනයට ද දක්ෂ වූ මෙතුමා පෙර අපර දෙදිග විවිධ තූර්ය භාණ්ඩ වාදනය කිරිමට දක්ෂ අයෙක් විය.
- රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයේ (වර්තමානයේ සෞන්දර්යය කලා විශ්ව විද්‍යාලය) 60 දශකයේ මුල් භාගයේ කථිකාචර්යවරයෙකු ලෙස පහතරට නර්තන සම්ප්‍රදාය වෙනුවෙන් සේවය කළ පුද්ගලයෙකි.
- මොහු පහතරට නර්තනයේ හස්ත පාද ක්‍රමවත්ව ගොඩනැගිමට මහඟු මෙහෙවරක් කළ අයෙකි.
- රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයේ එවකට සේවය කළ එස්.එල්.එච්. ප්‍රනාන්දු, කේ.එස්.ප්‍රනාන්දු සහ සචිරිස් සිල්වා යන ශිල්පින් සමඟ එක්ව් පහතරට නර්තනයේ නොතිබුණු පා සරඹ හා ඉලංගම් සරඹ නමින් සරඹ පද්ධති 2ක් නිර්මාණය කිරිමේ ගෞරවයද මෙතුමාට හිමිවිය.
- මාතර බෙන්තර ශෛලීන්ට අයත් ශුද්ධ මාත්‍රයේ පද කොටස් එක් කොට වත්මනෙහි භාවිතාවන ශුද්ධ මාත්‍රය, දෙවොල් පද 7, සුරල් 7, ක්‍රමවත්ව සකස් කිරිමේ ගෞරවය ද මෙතුමාට හිමිවේ.
- සම්ප්‍රදායික නර්තන අංග මෙන්ම නව නර්තනාංග එක් කොට ‘‘රංග ලීලා ‘‘ නමින් නර්තන ප්‍රසංගයක් පැවැත්විම ද පහතරට නර්තන කලාවට එතුමාගෙන් සිදුවූ සේවාව අතිමහත්ය.

### අර්නෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමා

- ඉසෝහාමි හා පොඩි සිංඤෝ යුවලට උපන් දරුවන් 12 ගෙන් දෙවැනියාය. ඔහු 1925 ගලපිටමඩ ඉඹුල්ගොඩ ග්‍රාමයේ උපත ලද අයෙකි.
- 8 ශ්‍රේණිය දක්වා පාසැල් අධ්‍යාපනය ලද මෙතුමා මංගලතිරිය ගුරුතුමාගෙන් නර්තනය, ගායනය ප්‍රගුණ කළහ.
- අල්ගම කිරිගණිත ගුරුතුමාගෙන් උඩරට නර්තනය හැදෑරූ ඔහු දක්ෂ නර්තන ශිල්පියෙක් විය.
- ලංකා ගාන්ධර්ව විභාගය සමත්ව සිටි මොහු 1951 බෙන්තොට ගාමිණි විද්‍යාලයේ නැටුම් උපදේශක ලෙස පත්විය.


- මෙතුමා ඉන්දියාවට ගොස් කතකලි නර්තනය ශ්‍රී ගෝපිනාත් ශිල්පියා යටතේ හදාරා නැටුම් පිළිබඳව පුහුණුවක්ද ලබා ගත්හ.
- 1954 බලපිටිය ගුරු විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙස පත්වූ ඉඹුල්ගොඩ මහතා 1956 රජයේ ලලිත කලායතනයේ කථිකාචාර්යවරයෙකු ලෙසද කටයුතු කලේය.
- කැළණි විශ්ව විද්‍යාලයේ සෞන්දර්යය අධ්‍යයන ආයතනය බවට පත්වූ මෙම ආයතනයේ ද සේවය කළ මොහු අති දක්ෂ උඩරට නර්තන ශිල්පියෙකු මෙන්ම නර්තන කලාවේ ප්‍රගමනයට දායකත්වයක් දුන් ශිල්පියෙකු මෙන් දක්ෂ ගායකයෙකි.
- නව නිර්මාණකරණයට තාලය, රිද්මය සුසංයෝග කරමින් උඩරට නර්තනයේ ශාස්ත්‍රීය නර්තන අංගවල ඒකාකාරී රටාවෙන් බැහැරව සම්ප්‍රදායික ලක්ෂණයන්ට හා අනන්‍යතාවයට හානි නොවන අයුරින් වඩාත් ආකර්ශනීයත්වයෙන් නර්තනය ඉදිරිපත් කිරීමට මහත් වෙහෙසක් දැරූ ශිල්පියෙකි.
- භාරතයේ නර්තන ශෛලීන්ගේ විවිධ හැඩතල හා රිද්ම එක්කොට සජීවී නර්තන ශෛලියක් බිහි කළ අයෙකි.
- රංජනා, තංගරාජා යන අය සමඟ එක්වී විජයාවතරණය, ජානකීහරණය සහ උන්මාද චිත්‍රා යන මුද්‍රානාට්‍යවල රඟපෑ ඉඹුල්ගොඩ මහතා 1957 උදාව ,1 961 වේදනා 1968 රන්දද නැමති මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය කරන ලදී.
- බෘනායි, තායිලන්තය සහ ජර්මනිය යන රටවල සංචාරය කරමින් උඩරට නැටුමේ අගය ලොවට හෙළි කරමින් 1986 ජනාධිපති කලාභූෂණ සම්මානයද හිමිකර ගත් අයෙකි.

ඇගයීම :- ඉහත සඳහන් ශිල්පීන් දෙදෙනාගේ නර්තන සම්ප්‍රදායන්, ජීවන තොරතුරු, ඔවුන්ගේ කුසලතා හා නර්තන කලාවට ලබා දුන් දායකත්වය පිළිබඳ ඇගයීමක් කරන්න.

09 ශ්‍රේණිය නර්තනයට අදාලව, තෙවන වාරයට නියමිත, "**කථක් නර්තන සම්ප්‍රදාය**" පාඩමට අදාලව විෂයය කරුණුමෙහි ඇතුළත් කර ඇත. හොදින්කි යවා, අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න


## කථක් නර්තන සම්ප්‍රදාය

කථක් නර්තනය උත්තර භාරතයේ මහා රාෂ්ටය, ගුජ්රාට්, රාජස්ථාන්, දිල්ලි, ලක්නව් යන ප්‍රදේශවල ප්‍රචලිතව පවති.




පාරම්පරිකව එන ශාස්ත්‍රීය නර්තන අංගය කතාවක් කිම යන තේරුම ඇති කථක් හෙවත් කථක යන සංස්කෘත නාමයෙන් මෙය ඇති වි ඇත. මෙහි ප්‍රධාන ලක්ෂණය වනුයේ,නර්තන මාධ්‍ය කරගෙන තාල, රිද්ම, අංග,ප්‍ර ත්‍යාංග, උපාංග උපයෝගි කර ගනිමින් කතාව රඟ දැක්විමයි. මෙම නර්තනයේ නෘත, නෘත්‍ය, නාට්‍ය යන අංග 3 ම දක්නට ලැබේ.

කථක් නර්තනය මුල් යුගයේ හින්දු සංස්කෘතික ලක්ෂණ වලින් ක්‍රිෂ්ණ භක්තිය හා බැදුනු ආගමික නර්තනයකින් හෙබි වුවත් ක්‍රි.ව. 1526 සිට මෝගල් අධිරාජයන්ගෙන් පසුව මුස්ලිම් ආභාෂය ලබමින් විවිධ වෙනස්කම් වලට භාජනය විය.15-16 වන සියවස්වලදි මෙහි ගායනය,රංගනය,නර්තනය ඇතුළත් නිර්මාණය වු නර්තන කලාවකි.



මෙම නර්තනාංගයට මුලික වී ඇත්තේ රාමායනය,මහාභාරතය වැනි සම්භාව්‍ය ග්‍රන්ථයන්ගේ කථා මුලික කොටගෙන ප්‍රචලිත වු නර්තනයකි. නූතනයේ ප්‍රචලිත සරානා මෙම නර්තන කලාව ඉගෙනිමට තිබූ

ගුරුකුල ලෙස නම් කළ හැකිය. ඒවා  එක් එක් ප්‍රදේශවල ප්‍රචලිත වු අතර විවිධ පුද්ගලයන්ගේ දායකත්වය අනුව ගොඩ නැගී ඇත.

1. ලක්නව් සරානාව.                    නවාබ් වජීඩ් අලීෂා  19 ශත වර්ෂයේ ගොඩ නැගූ නර්තන සම්ප්‍රදායකි.

2. ජායිපූර් සරානාව.                    ජායිපූර් ප්‍රදේශයේ ගොඩනැගුණු නර්තන සම්ප්‍රදායකි.

3.  බෙනාරිස් සරානාව .                බෙනාරීස්  ප්‍රදේශයේ ගොඩනැගුණු නර්තන සම්ප්‍රදායකි.

4.  රායිගර් සරානාව .                   රායිගර් ප්‍රදේශයේ ගොඩනැගුණු නර්තන සම්ප්‍රදායකි.

මෙම නර්තන සම්ප්‍රදායේ සංගීතය  සඳහා උත්තර භාරතීය රාගධාරී සංගීතය හෙවත් හින්දුස්ථානිය සංගීතය යොදා ගනිමින් රාග පදනම කරගෙන වාදන සඳහා තබ්ලාව, පක්වාජ්, සර්පිනාව, සිතාරය, තාම්පුරාව, සාරංගිය හා බටනළාව භාවිතයට ගැනේ.









මෙම නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංග ලෙස භූමිවන්දනාව ආමද්, සලාම්, බෝල්, ටුකඩා, පරන්, චක්‍රදාර්, ගත්, තත්කාර් යන අංග හැඳින්විය හැකිය.  කථක් නර්තනයේ රංග වස්ත්‍රාභරණ මුස්ලිම් ආභාසය ඇත. එම රංග වස්ත්‍රාභරණ ඉතා අලංකාරය. දිල්ලි කථක් කේන්ද්‍රය, භාත්කණ්ඩ විශ්ව විද්‍යාලය මෙම නර්තන අංගය ඉගෙන ගැනිමට ඇති ආයතන වේ.




දිල්ලි කථක් කේන්ද්‍රය



භාත්කණ්ඩ විශ්ව විද්‍යාලය

මෙම නර්තනාංගය දියුණු කිරිමට දායක වු ශිල්පීන් ලෙස **නවාබ් වජීඩ් අලීෂා, අච්චන් මහාරාජ්,බිර්ජු මහාරාජ්** යන ශිල්පින් හැඳින්විය හැක.

වර්ෂ 1822 දී උපත ලැබු නවාබ් වජීඩ් අලීෂා අවාද් රටේ 5 වැනි රජු ලෙස කටයතු කර ඇත. නර්තනය, නාට්‍ය, සංගීතය හා කථා ප්‍රබන්ධයට දක්ෂතා දක්වා ඇති අතර ආගමික සිද්ධස්ථානවලට සීමා වු කථක් රාජ සභාවන්හි රඟ දැක්විමට කටයතු කළහ. කථක් නර්තනයට සම්බන්ධ ග්‍රන්ථ රචනා කර ඇත



බිර්ජු මහා රාජ් ගේ පියා අච්චන් මහා රාජ් ය, පාද චලන මෙන්ම භාව ප්‍රකාශනය හා නෘත්ත ලක්ෂණ මැනවින් දැක්විමට හැකි දක්ෂ ශිල්පියෙකි. රාජ සභාවන්හි නර්තන දක්වා ප්‍රසංශා ලබා ඇත.



බිර්ජු මහාරාජ් සංගීත් භාත්කණ්ඩ ආයතනයේ හා කථක් කේන්ද්‍රෙය් ගුරුවරයෙක් ලෙස සේවය කර ඇත. නෘත,නෘත්‍ය ගණයේ නර්තනයන් දැක්විමට දක්ෂය. රාජසම්මාන රාශියක් ලබා ඇත.



ඇගයිම:-

1. කථක් නර්තනය ප්‍රචලිත ප්‍රදේශ නම් කරන්න.

2. නර්තන,සංගීත සම්ප්‍රදාය,වාද්‍ය භාණ්ඩ පිළිබඳ විස්තරයක් කරන්න.

3. කථක් නර්තනය අධ්‍යාපන ආයතන දෙකක් නම් කරන්න

4 කතක් නර්තන සරානා (ගුරුකුල) නම් කරන්න.

4. කථක් නර්තනය දියුණු කිරිමට දායක වු ශිල්පින් හඳුන්වන්න

<u>09 ශ්‍රේණිය නර්තනයට අදාලව, තෙවන වාරයට නියමිත,</u> "**දේශිය නාට්‍ය වර්ග**" පාඩමට අදාලව විෂයය කරුණු මෙහි ඇතුළත් කර ඇත .<u>හොදින් කියවා, අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න</u>

## <u>දේශිය නාට්‍ය වර්ග</u>

නාට්‍ය යනු යමක් කර පෙන්විමයි. නාට්‍යයක් ඉදිරිපත් කරන ආකාරය අනුව ශෛලීන් 2කි.

ලෝක ධර්මී ශෛලිය නාට්‍ය ධර්මී ශෛලිය.

**ලෝකයේ ස්වාභාවයට** අනුව නාට්‍යක සතර අභිනය වන සාත්වික අභිනය, වාචික අභිනය, ආංගික අභිනය, ආහාර්ය අභිනය භාවිතා වන්නේ නම් එය ලෝක ධර්මි ලෙස හඳුන්වයි. එසේ නොවන අතිශොක්තියෙන් ඉදිරිපත් කරන නාට්‍ය **නාට්‍ය ධර්මී ශෛලියට** අයත් ඒවා වේ.

නාට්‍ය වර්ග වන්නේ,

- තාත්ත්වික නාට්‍ය
- ශෛලිගත නාට්‍ය
- ගීත නාට්‍ය
- මූ නාට්‍ය. ලෙසයි.

**තාත්ත්වික නාට්‍ය:-** යම් අවස්ථාවක් ස්වාභාවිකවම ඉදිරිපත් කරන අතර නරඹන්නාට එය තමාගේ අත් දැකිමක් වශයෙන් විඳගැනිමට හැකි නාට්‍ය තාත්ත්වික නාට්‍ය ශෛලිය ලෙස හඳුන්වයි. උදා:-කැළණි පාලම, මෝදර මෝල නාට්‍ය.

**ශෛලිගත නාට්‍ය:-** ජිවිතයේ විවිධ අවස්ථා සැබෑ ස්වරූපයෙන් බැහැරව අතිශෝක්තියෙන් වර්ණනා කෙරෙන නාට්‍ය විශේෂයක් ලෙස මෙය හඳුන්වයි. තාලය හා රිද්මය පදනම් කොට ගෙන දෙබස් උච්චාරණය මෙන්ම නර්තනය යොදා ගැනිම විශේෂ ලක්ෂණයකි. ඊටම ආවේනික ශෛලියක් අනුගමනය කරමින් පොතේ ගුරු මඟින් චරිත වේදිකාවට කැඳවිම සමඟ ඒ ඒ චරිත වේදිකාවට ප්‍රවිෂ්ට වේ. මෙහිදි අභිනයන් මෙන්ම ගමන්තාල, වෙස් මෝස්තර යොදා ගැනිම තවත් විශේෂ ලක්ෂණ වේ.

උදා:,

| ශෛලිගත නාට්‍ය නිෂ්පාදකවරුන් | ශෛලිගත නාට්‍ය |
|---|---|
| මහාචාර්යය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා | මනමේ, සිංහබාහු |
| හෙන්රි ජයසේන මහතා | කුවේණි, හුණුවටය කථාව |
| දයානන්ද ගුණවර්ධන මහතා | නරිබෑණා, මධුර ජවනිකා |

**ගීත නාට්‍ය:-** නාට්‍යයට අදාළ සියලුම දෙබස් ගීතයෙන් ඉදිරිපත් කෙරෙන බැවින් එය ගීත නාට්‍ය වේ. වාචික අභිනයට ප්‍රමුඛස්ථානයක් ලබා දෙන මෙම ගීත නාටක රඟ දැක්වීමේදී නළු නිළියන් විසින්ම ගායනය කළ යුතු අතර ඔවුනට ගායනය සහ රංගනයටද දක්ෂතා තිබිය යුතුය. ගීතය සමඟ රිද්මයානුකූල චලන භාවිතා කිරිමද විශේෂයකි.

උදා:-

| නාට්‍ය නිෂ්පාදකවරුන් | ගීත නාට්‍ය |
|---|---|
| මහාචාර්යය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා | පේමතෝ ජායති සෝකෝ |
| ප්‍රේමසිරි කේමදාස මහතා | කැලෑ මල් |
| ඩබ්.ඩී. මකුලොළුව මහතා | දෙපානෝ |

**මුද්‍රා නාට්‍ය:-** අනෙක් නාට්‍ය කලාවන් අතර මෙම නාට්‍ය වර්ගය විශේෂ වේ. කිසියම් තේමාවක් පදනම් කරගෙන වාචික අභිනයෙන් තොරව චලන ,මුද්‍රා භාවිතයෙන් අදහස් ප්‍රකාශ කරන නාට්‍ය විශේෂය මුද්‍රා නාට්‍ය නම් වේ, කතා පුවත් නර්තන මාධ්‍යයන් ඉදිරිපත් කරන විට සංගිතය ප්‍රබලව මෙයට දායක කර ගනු ලැබේ. ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍ය කෙරෙහි ඉන්දියානු නර්තන කලාව ප්‍රබල ලෙස බලපෑ ඇත. බටහිර මුද්‍රා නාට්‍ය ආභාසයෙන් ලාංකීය මුද්‍රා නාට්‍ය කලාව ද ඇතැම් විට නිර්මාණය වී ඇති බව පෙනේ.1936 ශාන්ති දේව ඝෝෂ් නිෂ්පාදනය කළ **සීතාහරණ** ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රා නාට්‍ය වේ.

ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත මුද්‍රා නාට්‍ය ලෙස,

| නාට්‍ය නිෂ්පාදකවරුන් | මුද්‍රානාට්‍ය |
|---|---|
| චිත්‍රසේනන ඩයස් මහතා | කරදිය,නලදමයන්ති, චණ්ඩාලිකා, ශිවරංග |
| වජිරා චිත්‍රසේන මහත්මිය | හිම කුමාරි,රන් කිකිළී |
| ප්‍රේම කුමාර එපිටවෙල මහතා | සැලළිහිණි,පරවිය,ගමන |
| එස්. පණීභාරත මහතා | සත් පත්තිනි,ගුහ අපලය |
| ඊ.ඒ. ඉඹුල්ගොඩ මහතා | උදාව,රන්දද |

මුද්‍රා භාවිතයට වඩා ඉඟි යොදා ගැනිම පසුබිම් ගීත භාවිතා කිරිම නිසා දේශිය මුද්‍රා නාට්‍ය **ඉඟිනළු** යනුවෙන්ද හඳුන්වයි.

ඇගයිම:- 1. නාට්‍ය ශෛලින් වර්ග කර දක්වන්න.

2. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත නාට්‍ය වර්ග නම් කරන්න.

3. ඉහත පාඩම හොඳින් කියවා වටහා ගත්තේ නම් පහත සඳහන් වගුව පුරවා ජයග්‍රහණය උදාකර ගන්න

| නාට්‍ය වර්ගය | නිෂ්පාදකයන්ගේ නම | නාට්‍ය වල නම් |
|---|---|---|
| ශෛලීගත නාට්‍ය | 1.මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා<br><br>2.හෙන්රි ජයසේන මහතා<br><br>3.දයානන්ද ගුණවර්ධන මහතා | 1.................................................<br>2..............................................<br>1................................................<br>2...............................................<br>1...............................................<br>2.............................................. |
| ගීත නාට්‍ය | 1.මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා<br>2.ප්‍රේමසිරි කේමදාස මහතා<br>3.ඩබ්.ඩී.මකුලොළුව මහතා | 1................................................<br>1...........................................<br>1............................................. |
| මුද්‍රා නාට්‍ය | 1. චිත්‍රසේන ඩයස් මහතා<br><br>2. වජිරා චිත්‍රසේන මහත්මිය<br><br>3. ප්‍රේමකුමාර එපිටවල මහතා<br><br>4. එස්.පණිභාරත මහතා<br><br>5. ඊ.ඒ.ඉඹුල්ගොඩ මහතා | 1...............................................<br>2..............................................<br>1.................................................<br>2...............................................<br>1...........................................<br>2..............................................<br>1..........................................<br>2...........................................<br>1............................................<br>2.......................................... |
| තාත්වික නාට්‍ය | 1. රංජිත් ධර්ම කීර්ති මහතා<br>2. ආර්.ආර්. සමරකෝන් මහතා | 1............................................<br>1............................................ |